

# 9 – පාඩම අවුරුදු සිහිනය



## ක්‍රියාකාරකම 1

❖ සුදුසු පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. ………………… නවකතාවක් මෙන් දිග කතාවක් නොවේ .

i බණ කතාව ii කෙටිකතාව iii ජන කතාව iv චරිත කතාව

2 . කෙටි කතාවක ලක්ෂණයක් **නොවන්නේ**

i එක් ප්‍රබල චරිතයක් ii එක් සිදුවීමක් iii සංක්ෂිප්ත බව iv සිදුවීම් ගණනාවක් ඇතුළත් වීම

3 . “ අවුරුදු සිහිනය ” කෙටිකතාව …………………… කෘතියෙන් උපුටා ගෙන ඇත .

i රතු රෝසමල ii කරුමක්කාරයෝ iii දෙපා නොලද්දෝ iv අමල් බිසෝ

4 . ගුණදාස අමරසේකර මහතාගේ කෘතියක් **නොවන්නේ**

i ගම් පෙරළිය ii විල්තෙර මරණය iii යළි උපන්නෙමි iv රතු රෝස මල

5 . ගුණදාස අමරසේකර මහතා වෘත්තියෙන් ……………………. වේ .

i ගුරුවරයෙක් ii ගීත රචකයෙක් iii වෛද්‍යවරයෙක් iv ගායකයෙක්



# ක්‍රියාකාරකම 2

**★වරහන් තුළින් පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න .**

1. පියසේන තම මවට ලිපයක් යැව්වේ ……………………………. ඉල්ලාය .

   ( පොත් ගැනිමට මුදල් / අලුත් ඇඳුම් ගැනිමට මුදල් / අවුරුද්දට ගමට එක්ක යන ලෙස )

2 . අම්මා පමා වන විට පියසේන තුළ බියක් ඇති වූයේ ………………………. ය .

   ( මගදී අනතුරක් සිදුවීම නිසා / මගදී අනතුරක් සිදු වී දැයි සිතුණ නිසා / පියසේනට ගුටි කන්නට සිදුවන නිසා )

3 . පියසේන නූල් රෝදයක් ගෙන ඒමට සතුටින් ගියේ ……………………. නිසා ය .

   ( අම්මා මග දි හමු විය හැකි / රස කැවිලි කෑ හැකි / නගරට යාමට ඇති ආශාව )

4 . බොත්තමක් මිලදී ගැනීමට පියසේන පෙළඹුණේ ……………………………. අවශ්‍ය නිසා ය .

   ( කමිසයට ඇල්ලීමට / අම්මාට පණිවිඩය යැවීමට / ස්වාමිදුවට ගෙන යාමට )

5 . පියසේන දුටු සිහිනයෙන් කතුවරයා ප්‍රකාශ කරන්නේ ………………………… යි .

   ( ස්වාමිදුවගේ අකාරුණික බව / අම්මා පැමිණි බව / අවුරුද්දට ගෙදර යෑමේ ආශාව )





ක්‍රියාකාරකම 3

“අ ”කොටසේ සඳහන් යෙදුමේ අදහස “ආ” කොටසෙන් තෝරා යා කරන්න .

| අ | ආ |
|---|---|
| 1 . පාඨකයා | සිතෙහි මැවෙන රූප |
| 2 . කුතූහලය | ලේඛන කාර්යයෙහි යෙදෙන්නා |
| 3 . ප්‍රේක්ෂකයා | කියවන්නා |
| 4 . චිත්තරූප | යමක් දැන ගැනීමට ඇති ආශාව |
| 5. ලේඛකයා | නරඹන්නා |



## ක්‍රියාකාරකම 4

පහත සඳහන් පාඨවල  අවස්ථා සම්බන්ධය (කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවේ ) ලියන්න.

| අ අ | පාඨය | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|---|
| 1 | “ ඔව් , කවුරුනුත් දන්වනවා .කාටත් එහෙමයි ” | | | |
| 2 | “උඹ සල්ලි එහෙම නැති කරව ගන්න නෙවෙයි ” | | | |
| 3 | “උඹ ළඟ සල්ලි තියෙනව ද ? ” | | | |
| 4 | “ පලයන් යන්න කොබෝගම ගැන අහන්න ආවා ” | | | |
| 5 | “කෝ කජු මල්ල.... ? කෝ.... ? උඹලා නැති කරලා” | | | |
| 6 | “ ඔව් , කියන්න කොහොම හරි මාව එක්ක යන්න එන්නයි කියලා  හෙට උදේම . ” | | | |
| 7 | “අනේ බලා ගන්න හොඳ හැටි ” | | | |
| 8 | “පොලිසියෙන් දන්වන්වා ඒ ඉන්න තැනකට ” | | | |

## ❖ ක්‍රියාකාරකම 5

**පහත සඳහන් එක් එක් වාච්‍යාර්ථවලට ගැළපෙන යෙදුම් පාඩමෙන් සොයා ලියන්න .**

1 .ඔහුගේ සිතේ සතුටක් ඇතිවිණි . ………………………………………………………...

2 . පියසේනගේ සිතට ශෝකයක් ඇතිවිය . ……………………………………………..

3 .ක්‍රමයෙන් ඉර බැස යයි ……………………………………………………………….

4 . පුදුම වූ බව ඔහුගේ දෙනෙත්වලින් පෙනෙන්නට විය . ………………………………………………...

5. ඔහු නොඉවසිල්ලෙන් පාර දෙස බලා සිටින්නට විය …………………………………………



හිරු එළිය ද දැන් ක්‍රමයෙන් ගෙවී යයි .

පියසේනගේ සිත ශෝකයෙන් පිරෙන්නට විය

ඔහු ඇඟිලිතුඩින් නැඟී පාර දෙස බලා සිටින්නට විය .

ඔහුගේ සිත ප්‍රීතියෙන් සිනාසෙන්නට විය

ඔහුගේ දෑස විස්මයෙන් වෙළී ගියේ ය

❖

# ක්‍රියාකාරකම 6

පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

1 . කෙටි කතාවක ඇත්තේ ප්‍රධාන සිද්ධි එකකි .

2 . භාෂාව කෙටි කතාවක සාර්ථකත්වයට බෙහෙවින් බලපායි .

3 . දීර්ඝ කාලයක් තිස්සේ සිදුවුණු සිදුවීම් දිග හැරෙන කතා කෙටි කතා ය .

4 . කෙටි කතාවක අවස්ථා හා සිද්ධි අතර මනා සම්බන්ධතාවයක් පවතී .

5 . නවකතාවක ප්‍රධාන චරිත ඇත්තේ එකක් පමණි .

6 . කෙටි කතාවක ප්‍රධාන සිද්ධිය හැඩ කරන්නේ අවශේෂ සිද්ධි සමූහය යි .

7 .දක්ෂ කෙටිකතාකරුවා රූප මවමින් නිර්මාණය රසවත් කරන්නේ භාෂාව මඟිනි .

8 . අඹ යාළුවෝ කෙටිකතාවකට උදාහරණයකි .

9 . නවකතාවක එක් එක් සිදුවීමට අදාළ ව එක් එක් පුද්ගල කණ්ඩායම් වේ .

10 . හැඟීම් දැනෙන ආකාරයට කතාව ඉදිරිපත් කර තිබීම සාර්ථක කෙටිකතාවක ලක්ෂණයකි .

## ප්‍රායෝගික අභ්‍යාසය

“අපේ අලුත් අවුරුද්ද” යන මැයෙන් වචන 200 ක පමණ රචනාවක් ලියන්න .

❖ 

# පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . කෙටිකතාව

2 . සිදුවීම් ගණනාවක් ඇතුළත් වීම

3 . රතු රෝසමල

4 . ගම්පෙරළිය

5 . වෛද්‍යවරයෙක්

## ක්‍රියාකාරකම 2

1 . අවුරුද්දට ගමට එක්ක යන ලෙස

2 . මගදී අනතුරක් සිදු වී දැයි සිතුණ නිසා

3 . අම්මා මග දි හමු විය හැකි

4 . අම්මාට පණිවිඩය යැවීමට

5 . අවුරුද්දට ගෙදර යෑමේ ආශාව

## ක්‍රියාකාරකම 3

1 . කියවන්නා

2 . යමක් දැන ගැනීමට ඇති ආශාව

3 . නරඹන්නා

4 . සිතෙහි මැවෙන රූප

5 . ලේඛන කාර්යයෙහි යෙදෙන්නා

❖ ක්‍රියාකාරකම 4

| | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|
| 1 | කුස්සියේ සිටි ගැහැනිය | පියසේනට | අම්මාට මොකක් වුණාද යි දැන ගැනීමට හැකි ක්‍රමයක් විමසන අවස්ථාව |
| 2 | ස්වාමිදුව | පියසේනට | නූල් රෝද දෙකක් ගෙන එන්නට පියසේනට කියන ලද අවස්ථාව |
| 3 | රතිඤ්ඤා මුදලාලි | පියසේනට | රතිඤ්ඤා පෙට්ටි ගොඩ ඇල්ලූ අවස්ථාව |
| 4 | බුලත් විට විකුණන ආච්චි | පියසේනට | කොබෝගම ගැන දන්න කෙනෙක් ද යන්න විමසූ අවස්ථාව |
| 5 | පියසේන | පියසේනට | පසු දින ගෙදර යාමට සිතා සතුටින් නිදා සිටිද්දී හීනයක් දකින අවස්ථාව |
| 6 | පියසේන | බොත්තම් මුදලාලිට | කොබෝගම ගැන දන්න කෙනෙක් බව පියසේනට හැඟ වූ අවස්ථාව |
| 7 | පියසේනගේ මව | ස්වාමිදුවට | පියසේන කොළඹට යාමට කාරයට නඟින අවස්ථාව |
| 8 | කුස්සියේ සිටි ගැහැනිය | පියසේනට | අම්මාට මොකක් වුණාද යි දැන ගැනීමට හැකි ක්‍රමයක් විමසන අවස්ථාව |

❖ ක්‍රියාකාරකම 5

1 . ඔහුගේ සිත ප්‍රීතියෙන් සිනාසෙන්නට විය .

2 . පියසේනගේ සිත ශෝකයෙන් පිරෙන්නට විය

3 . හිරු එළිය ද දැන් ක්‍රමයෙන් ගෙවී යයි .

4 . ඔහුගේ දෑස විස්මයෙන් වෙළී ගියේ ය

5 . ඔහු ඇඟිලිතුඩින් නැඟී පාර දෙස බලා සිටින්නට විය .

ක්‍රියාකාරකම 6

1 . √

2 . √

3 . X

4 . √

5 . X

6 . √

7 . √

8 . X

9 . √

10 . √